පසුගිය දිනක සරසවියෙන් අතුරුදන් වූ බවට පැවසෙන පේරාදෙණිය සරසවියේ සිසුවා පිළිබඳ පුවතක්, අරුණ පුවත්පතේ (ඔක්.05, 2022) දැක්වේ. එහි සිරස්තලය දැක්වෙන්නේ, "පේරාදෙණිය අතුරුදන් වූ සිසුවාට ප්‍රේමාතතියලු" යනුවෙනි.

ඔබ සිතන ආකාරයට,

1) මානසික පීඩාවක් හේතුවෙන් යම් අයෙකු සිදුකරනා ක්‍රියාවක් මෙසේ එක් සරල හේතුවකට සීමා කොට දැක්වීම ඔස්සේ, ආතතිය, විෂාදය ඇතුළු මානසික සංකූලතාවන් පිළිබඳ වැරදි අදහසක් සමාජයට නොයන්නේ ද?

2) මෙම සිරස්තලය ඔස්සේ, අදාල සිසුවාට වක්‍රාකාරව දෝෂාරෝපණය කරන බවක් ඔබට හැඟෙන්නේ ද? එසේ නම්, එයද මානසික සංකූලතාවන් පිළිබඳව වැරදි අදහසක් සමාජයට ලබා නොදෙන්නේ ද?

3) මෙම සිරස්තලය අසංවේදී යැයි ඔබ නොසිතන්නේද? ඒ ඔස්සේ අදාළ සිසුවාට/ඔහුගේ පවුලේ අයට සිත් වේදනාවන් ඇති නොවන්නේ ද?